# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2026/5 - 2017 ජූලි මස 03 වැනි සඳුදා - 2017.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : උදු2/2/10/42.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : L/3J/95/FR/189.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේකන්ද නිලධාරි වසම තුළ පිහිටි කරපිලහේන් ගැටේ හේන නම් වූ සර්වේ ජනරාල්ගේ අංක අ.ග.පි. 426, අතිරේක අංක 1, පත්‍ර අංක 1 දරන පිඹුරේ කැබලි අංක 269 න් දැක්වෙන හෙක්ටයාර් 1.1410 ක් වූ ඉඩම.

**හිමිකම් කියන අය:- එච්. එම්. ජී. ජී. රනවීර බංඩා මයා, අංක 221, වෙලංකැටිය, කලුගල.**

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 10.00 ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2017 අගෝස්තු මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවයන්ට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සුජානි ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2017 ජුනි මස 14 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 472

1A - G 25824 - 29 (2017/07)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.